ස.සේ.කො.චක්‍රලේඛ අංක 05/2020

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2020.12.28

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල.
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු,

## සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හා උසස් කිරීම් ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස සේවය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.

සමුපකාර සමිති/ සංගම් සඳහා සේවකයින් බඳවා ගැනීම හා ශ්‍රේණි උසස් කිරීම් සලකා බැලීම සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල හා උසස්වීම් ඇගයීම් කමිටුවල සාමාජිකයින් සඳහා සෑම එක් එක් සාමාජිකයකුටම පරීක්ෂණ මණ්ඩලයකට/ඇගයීම් කමිටුවකට සහභාගි වීම වෙනුවෙන් සහභාගීත්ව දීමනා වශයෙන් රු.1,500.00 දීමනාවක් ගෙවීමටත්, 2016.07.25 දිනැති ස.සේ.කො. 3/2016 චක්‍රලේඛය අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට /ඇගයීම් කමිටුවකට සහභාගී වීම වෙනුවෙන් සහභාගීත්ව දීමනා වශයෙන් රු.1,000.00 දීමනාවක් ගෙවීමටත්, ඊට අමතරව සම්මුඛ පරීක්ෂණයට / උසස්වීම් ඇගයීම් කමිටුවකට භාජනය කරන පුද්ගලයින් සංඛ්‍යාව 15 හෝ ඊට වැඩි වන විට අදාල තනතුරෙහි වැටුප් පරිමාණය සැලකිල්ලට ගෙන පහත පරිදි දීමනාවක් ගෙවීමටත් හැකිය.

I. TSL වැටුප් පරිමාණය හා ඊට ඉහළ වැටුප් පරිමාණයක තනතුරු සඳහා බඳවා ගැනීම හෝ ශ්‍රේණි උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක/ උසස්වීම් ඇගයීම් කමිටුවක සෑම සාමාජිකයකුටම - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට/ උසස් කිරීම් ඇගයීමකට භාජනය කිරීම වෙනුවෙන් රු.50.00. දීමනාවක් (රුපියල් පනහයි)

II. SL වැටුප් පරිමාණය හා ඊට පහළ වැටුප් පරිමාණයක තනතුරු සඳහා බඳවා ගැනීම හෝ ශ්‍රේණි උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක/ උසස් කිරීම් ඇගයීම් කමිටුවක සෑම සාමාජිකයකුටම - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට/ උසස් කිරීම් ඇගයීමකට භාජනය කිරීම වෙනුවෙන් රු.25.00. දීමනාවක් (රුපියල් විසි පහයි)

02. TSL වැටුප් පරිමාණයේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයේ හෝ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල/ උසස්කිරීම් ඇගයීම් කමිටු වල සාමාජික සංඛ්‍යාව 05 ක් විය යුතු අතර, SL වැටුප් පරිමාණයේ හෝ ඊට පහළ වැටුප් පරිමාණයේ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල/ උසස්කිරීම් ඇගයීම් කමිටු වල සාමාජික සංඛ්‍යාව 03 ක් විය යුතුය.මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල/උසස් කිරීම් ඇගයීම් කමිටු සඳහා සාමාජිකයින් පත් කිරීමේ දී දැනට වයඹ/ස.සෙ.කො./05/2014/උපදෙස් ලිපියේ සඳහන් කර ඇති සාමාජිකයින් හයදෙනා (6) අතරින් පත්කිරීම් කල යුතුය. ඊට සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරියෙකු හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරියෙකු ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

03. බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ හා උසස් කිරීමේ ඇගයීම් කමිටු වලට පූර්වයෙන් පවත්වනු ලබන ඇගයීම් මණ්ඩල පැවැත්වීම මින් ඉදිරියට අනවශ්‍ය බවද පෙන්වා දෙමි.

04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල හා උසස්කිරීම් ඇගයීම් කමිටු සඳහා සාමාජිකයින් ලෙස සහභාගී වන නිලධාරීන්ට ගමන් වියදම් හා අතිකාල දීමනා ලබා ගැනීමේදී, එම නිලධාරීන්ට, දැනට මාසිකව අනුමත කර ඇති ගමන් වියදම්/අතිකාල දීමනා සීමාවන්ට යටත්ව ගෙවීම් කළ යුතුය. සති අන්ත හෝ රජයේ නිවාඩු දිනයක ඉහත රාජකාරි කටයුතු සඳහා සහභාගි වන්නේ නම් ඉහත ගෙවීම් වලට අමතරව නිවාඩු දින වැටුප / අතිකාල ලබා ගත හැකිය.

05.මෙම චක්‍රලේඛය 2021.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.